# විශ්ව සාහිත්‍ය අප දෙපාමුලට රැගෙන ආ මහා පරිවර්තකයා සිරිල් සී. පෙරේරා



රංජිත් ධර්මකීර්ති විසිනි

සිංහල සාහිත්‍ය සිතියමේ තවත් එක් මහාද්විපයක් මැකී ගියේය. 1923 වසරේ ජුනි මස 03 වැනිදා කළුබෝවිල ග්‍රාමයේ උපන් සිරිල් සී. පෙරේරා සූරීන් මෙම වසරේ සාහිත්‍යය මාසයේ හතරවැනි ඉරුදින දිවියෙන් සමුගැනීමට තෝරාගත්තේ වසර 93 ක තම ජීවන චාරිකාව අවසන් කරමිනි.

සිරිල් සී පෙරේරා සූරීන් නැමති මහාද්වීපය, ජලතලාවෙන් යටවී යළි කිසිදා නොපෙනෙන ලෙස සිංහල සාහිත්‍ය සිතියමෙන් එසේ මැකී ගියද එතුමා පුරා 66 වසරක් තිස්සේ සාහිත්‍ය කලාවන් වෙනුවෙන් කළ දැවැන්ත මෙහෙවර, මහාමේරු පර්වර්තයක් සේ අපට ඉතිරිව තිබීම භාග්‍යයක් සේ සැලකිය හැකිය.

1950 ස් ගණන් වන විට මෙරට සාහිත්‍ය ක්ෂේත්‍රය නව ගමන් මඟක් අරඹා තිබුණි. හේමපාල මුනිදාස, පියදාස සිරිසේන, ඩබ්.ඒ.සිල්වා හා මාර්ටින් වික්‍රමසිංහ ප්‍රමුඛ ලේඛකයෝ බටහිර නවකතාවට අනුරූප වූ නව ප්‍රබන්ධ සාහිත්‍යයක් ගොඩනැංවීමේ පුරෝගාමී මෙහෙවරක යෙදී සිටියහ. 1941 දී ආරම්භ වූ කොළඹ විශ්ව විද්‍යාලය හරහා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ප්‍රමුඛ විද්වත්තු පිරිසක් නූතන නාට්‍ය ව්‍යාපාරයක් බිහිකිරීම සඳහා උරදෙමින් සිටියහ. මෙම අඩිතාලම මතින් ගොඩනැගෙන නව නූතන සාහිත්‍ය මන්දිරයේ එක් ඌනතාවක් පවතින බව වටහාගත් එවකට විසිහත් වැනි වියේ පසුවූ තරුණයෙක් විශ්ව සාහිත්‍ය නැමති මාණික්‍ය ගබඩාවේ තැන්පත්ව තිබූ අගනා මිණිමුතු වලින් එම මන්දිරය සැරසිය යුතු යැයි කල්පනා කළේය. සිරිල් සී. පෙරේරා මෙම ඌනතාවය සපුරාලමින්

1950 තෝල්ස්තෝයිගේ කෙටිකථා සමුච්චයක් පරිවර්තනය කරමින් ''තෝල්ස්තෝයිගේ කෙටිකතා'' නමින් 1950 වසරේදී මොඩර්න් පොත් සමාගම මාර්ගයෙන් ස්වකීය ප්‍රථම පරිවර්තන කෘතිය එළිදැක්වීය. 1950 වසරේදී පරිවර්තන සාහිත්‍ය පෝෂණය කිරීමට එතුමා මෙහෙයවූ පැනද 2016 මීට මාස කිහිපයකට පෙර අසනීප වනතුරුම බිම තැබුවේ නැත.

නිකොලායි ගොගොල්ගේ ''මළ මිනිස්සු'' (1960), ගුස්ටාෆ් ෆ්ලෝබෙයාර්ගේ ''එමා බොවාරි'' (1962), ආතර් සී. ක්ලාක්ගේ ''ගැඹුරු මුහුද '' (1965), ''කරමසෝ සහෝදරයෝ''(1969), අර්නස්ට් හෙමිංවේගේ ''මහල්ලා සහ මුහුද '' (1971), ෆියඩෝර් දොස්තෝව්ස්කිගේ, හර්මන් මෙල්විල්ගේ, ''මෝබි ඩික්'' (1994) එතුමා අතින් පරිවර්තනය වූ මෙරට පාඨකයන්ගේ වින්දන හා චින්තන ශක්තිය පෝෂණය කළ විශිෂ්ඨ නවකතා අතර වේ. ප්‍රදීප ප්‍රකාශකයෝ නමින් ප්‍රකාශන ආයතනයක් පවත්වාගෙන ගිය අපේ මහා ලේඛක කේ. ජයතිලක ශූරීන්ගේ ආරාධනය පරිදි එතුමා ලියෝ තෝල්ස්තෝයිගේ ''යුද්ධය හා සාමය'' නැමති මහා නවකතා පරිවර්තනය කිරීමේ කාර්යය 1982 දී ආරම්භ කළේය. මෙැනි කෘතියක අලෙවිය ගැන සහතික වීම අපහසු වුවද එම නවකතාව සිංහල පාඨකයන් අනිවාර්යයෙන්ම කිව යුතු මහා නවකතාවක් බව පැවසූ ජයතිලක ශූරීන් නිර්භවය එහි බර පැන දරමින් තම මිතුරු සිරිල් සී. පෙරේරා ශූරීන් දිරිගැන්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම නවකතාව කාණ්ඩ 10 කින් 1991 වසරේදී ලියා අවසන් කිරීමට මේ ලේඛක දෙබෑයෝ සමත් වූහ. එසේම ආර්ථික ප්‍රතිලාභ ගැන නොසලකා එතුමාගේ ග්‍රන්ථ දිගටම පාඨකයා අතට පත්කළ එස්.ගොඩගේ ශූරීන්ගේ සේවාවද අප අගය කළ යුතුය.

නවකතා පමණක් නොව විශ්ව කෙටිකතා සාහිත්‍යයේ අගනා මිණිමුතු ගරමින් එතුමා ලියෝ තෝල්ස්තෝයිගේ කෙටිකතා පරිවර්තනය කිරීමේ ආරම්භ කළ ගමන ඇලෙක්සැන්ඩර් පුෂ්කින්, ගී ද මෝපසාන්, ෆියදෝර් දොස්තව්ස්කි, ඕ.හෙන්රි යන ලේඛකයන්ගේ කෙටි කථා ග්‍රන්ථ වශයෙන් එළිදැක්වීය. මේ හැරෙන්නට නිර්මාණය සහ ශෝකය හා පොතක මහිම නැමති කෙටිකතා ග්‍රන්ථ තුලින් මැක්සිම් ගෝර්කි නිකොලොයි ගොගොල්ගේ ද මෝපසාන් ඇතුළු ලේඛකයන් රාශියකගේ කෙටිකතා කියවීමේ භාග්‍යය සිංහල පාඨකයාට උදාකර දුන්නේය. එතුමාගේ පරිවර්තන කාර්යය ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල පමණක් සීමා නොවීය. ගුණසේන විතානයන් විසින් රචිත ප්‍රබන්ධ සාහිත්‍යය ග්‍රන්ථ 06 ක් එතුමා ඉංග්‍රීසි භාෂාවෙන් පළකිරිමෙන් පරිවර්තයෙකු ලෙස ඔහු සතුව පැවති ද්විභාෂිත හැකියාව ඥාණය ප්‍රදර්ශනය කළේය. එතුමා පුවත්පත් හා සඟරාව වලට ලියූ ලිපි සංඛ්‍යාව අතිවිශාලය. කොටින්ම රටවල් 18 ක අයත් ලේඛකයන් 110 දෙනෙකුගේ කෘති එතුමා සිංහල පාඨකයාට හඳුන්වාදී ඇත. ලේඛකයෙකු වශයෙන් ප්‍රගතිශීලී දෘෂ්ටියක පිහිටා කටයුතු කළ සිරිල් සී. පෙරේරා ශූරීන් ජනතා ලේඛක පෙරමුණේ උපසභාපතිවරයෙකු වශයෙන්ද සේවය කළේය. එතුමාගේ සේවය අගයමින් සෝවියට් සාම පදනම මඟින් පිරිනමන ලද ජාත්‍යන්තර සාම ත්‍යාගය දිනාගැනීම මෙරට ලේඛකයෙකු වශයෙන් ජාත්‍යන්තර කීර්තියටද පත්විය. සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් ජීවිත කාලයටම


























එක් වරක් ලේඛකයෙකුට පිරිනමන උසස්ම සම්මානය වන ''සාහිත්‍යය රත්න'' සම්මානය එතුමා 2006 වසරේදී හිමිකර ගත්තේය. විදේශීය රටවල් රාශියක සංචාරයක කිරීමෙන් ලැබූ අත්දැකීම් සතු වූ සිරිල් සී. පෙරේරා ශූරීන් මේ සා විශාල සාහිත්‍ය සේවයක් කලේ රජයේ ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පියෙකු ලෙස රජයේ රෝහල් සැලසුම් කිරීමේ රාජකාරි කටයුතුද අකුරට ඉටුකරමිනි. රත්තනපිටියේ සිංහල පාසලේ සිය අධ්‍යාපනය ආරම්භ කළ සිරිල් සී. පෙරේරා ශූරීන් නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලය, වැල්ලවත්ත වෛශාක්‍ය විද්‍යාලය හා කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලය මූලික අධ්‍යාපනය ලබා උසස් අධ්‍යාපනය පිණිස රජයේ කාර්මික විද්‍යාලට ඇතුලත් වී ගොඩනැඟිලි ඉංජිනේරු ශිල්පය ප්‍රගුණ කළේය. ඒ සමගම එතුමා කලා අංශයට නැඹුරු වෙමින් එහි චිත්‍ර කලා අංශයටද සම්බන්ධ විය. විවේක වේලා වලදී එතුමා අතින් නිම වූ සිතුවම් වලින් එතුමාගේ ගෘහයේ බිත්ති අලංකාර වී ඇත. බොහෝ ග්‍රන්ථ වල පිටකවර සැලසුම් කළේද එතුමාමය.

සිරිල් සී.පෙරේරා සූරීන්ගෙන් මෙරට ආධුනික පරිවර්තකයන්ට උගත හැකි ගුරුහරුකම් බොහෝය. එතුමාගේ ජීවිතයේ අවසාන කාලයේදී පරිවර්තනය කළ ගියෝවන්නී බොකාෂියෝ ගේ ''ඩී කැමිරෝන් හෙවත් දස දවස '' නැමති කතා සංග්‍රහයට 2008 දී ලියූ පෙරවදන එතුමාගේ පාණ්ඩිත්‍යයට දෙස් දෙයි. කිසියම් විදේශ ලේඛකයෙකුගේ කෘතියක් කියවූ විට එතුමා ඉන් ලබන වින්දනය හා තෘප්තියෙන් මත්වෙයි. ඉන්පසු මෙම රසය සිංහල පාඨකයාට විඳගැනීමට සැලසිය යුතු බව තීරණය කරයි. ඒ නිමිත්ත සිතට ආ පසු එතුමා එම කතුවරයාගේ සෙසු සියලුම කෘති කියවා බලයි. එපමණක් නොව එම ලේඛකයා අයත් රටේ භූගෝලීය හා සමාජ ආර්ථික තත්ත්වයන් මෙන්ම එම රටේ ඉතිහාසය තුළ එම ලේඛකයා ස්ථාන ගතවී ඇති ස්ථානය පළමුව ගවේෂණය කරයි. ඉන් අනතුරුව එම ලේඛකයාගේ දෘෂ්ටිය හා භාෂා ශෛලීය අවබෝධ කරගනී.

නිදසුනක් ලෙස එතුමා පරිවර්තනය කළ ''මහල්ලා සහ මුහුද' නැමැති නවකතාවේ බස් වහර අහසින් වැටෙන දිය බිඳු මෙන් සටපට ගාමින ඇදහැලෙන සැටි අපට පෙනේ. ලියෝ තෝල්ස්තෝයිගේ ''යුද්ධය හා සාමය'' කියනව විට දිගු මාවතක් ඔස්සේ හැල්මේ යන අයකු අවට ගස්වැල්, දිය පොකුණු, ගිරි දුර්ස, වන දුර්ස නිරීක්ෂණය කරමින් යන ගමනක් සේ, භාෂා ශෛලිය හසුරු ඇති ආකාරය අපට පෙනේ. ඒවා ඉතා නිවැරදිව හා මුල් ලේඛකයාගේ භාෂා ශෛලියකින් පරිවර්තනය කිරිමේ කුසලතාව එතුමා සතු විය. වර්තමාන බොහෝ පරිවර්තකයන් මේ කිසිවක් ගැන නොසලකා මුල් කෘතිය ඉතා සාහසික ලෙසින් විකෘති කරමින් තමාගේම බස්වහරින් ලහි ලහියේ අදහස පමණක් ඉස්මතු වන ආකාරයට ලියා නිමකර ඇති ආකාරය අපට පෙනේ.

1980 වසරේදී සිරිල් සී. පෙරේරා සූරීන් ජීවත් වූ කළුබෝවිල, රත්නාවලී පාරේ නිවෙසට මාවත් දෙකක් එපිටින් පිහිටි ඉසව්වක අප පදිංචියට පැමිණීමෙන් පසු පෙරේරා සූරීහු හා අප අතර ඇසුර බොහෝ සමීප විය. උදේ සිට හවස් වනතුරු පරිවර්තන කාර්යයෙහි නිරත වන පෙරේරා සූරීන් ඉතා චාම් සරල ගති ඇති මිනිසුන් ඇසුරු කිරීමට හා කතාබහ කිරීමට ප්‍රියකළ පුද්ගලයෙක් වූහ. හවස් භාගයේ විවේකය පිණිස එළිමහනට පිවිසෙන ඔහු අසල්වැසියන් හා පාරතොටේ හමුවන අය සමඟ කතා කරමින් ඇවිදීමට යන අතරේ නිතරම පාහේ අප නිවසට ද ගොඩවී නොයෙකුත් සාහිත්‍ය සාකච්ඡාවල නිරත වෙයි. ඉදහිට දවසක එතුමා බැලීමට කළුබෝවිල, රත්නාවලී පාරේ තරමක් විශාල වත්තක් මැද පිහිටි පෞරාණික නිවෙසට යනවිට අපට සිතුනේ පෙරේරා සූරීන් සතු ඉවසීම, අධිෂ්ඨාන ශක්තිය, දැවැන්ත වැඩ කිරීම සඳහා අවශ්‍ය නිහඬ පරිසරය, එම නිවෙස තුළ පිහිටා තිබුණු බවයි. පරිසරයට ඉතා ආදරය කළ සිරිල් සී. පෙරේරා සූරීන් එම වත්තේ පිහිටි නොයෙකුත් වර්ගවලට අයත් රුස්ස ගස් එකක් වත් කැපීමට ඉඩ දුන්නේ නැත.

'' ඔබේ නිවසට එන හැම වතාවකම මට මතක් වෙනවා ඇන්ටන් චෙකොෆ්ගේ බැවුම් එල සහිත නිවස යන කෙටිකතාව. එහි එන ශෙන්යා දුව පනින්නට ඇත්තේ මෙවැනි ගස් ගොම්මනක් මැද්දෙන් යැයි මට සිතෙනවා. මෙවැනි පරිසරයක ජීවත්වුණු ඔබ ලේඛයෙකු නොවුනා නම් පුදුමයි. මම කියමි.''

පරිසරයට විතරක් තිබුණට මදි ලේඛකයෙකුට හොඳ පරිකල්පනයක්, අධිෂ්ඨාන ශක්තියක්, අරමුණක් තියෙන්න ඕනේ අයිසෙ'' මේවා ලාභදායක වැඩ නොවෙයි අයිසෙ. ඒත් අපි නිදිමරාගෙන දුක් මහන්සි වෙලා කරන මේ කාර්යය ගැන භක්තියක් අප තුල තියෙන්න ඕනේ. ඔහු අවවාදාත්මක ස්වරූපයෙන් කියයි. තවත් දිනක සවස් භාගයේ මා එම නිවසට යන විට වත්ත සුද්ද පවිත්‍ර කිරීමට කැඳවාගෙන සිටි කම්කරුවෙකු ලවා වත්ත අතු පතු ගා සුද්ද කොට කොළ රොඩු ගිනි තබමින් සිටියේය. සාක්කුවෙන් මුදල් අතට ගත් එතුමා ආ...මේක තියාගන්න. දැන් ගිහින් වත්තේ අනික් පැත්ත සුද්ධ කරන්න. හෙට උදෙන්ම එන්න යැයි කියමින් කම්කරුවා අත මුදලක් තබා මා සමඟ පඩිපෙල නැඟ සිය නිවහනට ඇතුලත් විය.

''අයිසෙ දන්නවද දැන් කම්කරුවෙකුට කෑම බීම දීලා දවසකට රුපියල් 1200 /ක් ගෙවන්න ඕනේ. ඒ මිනිහා උදේ නවයට විතර ඇවිල්ලා හවස තුනහාමාර වෙනකොට සල්ලිත් අරගෙන යන්න යනවා. දැන් බලන්න ලේඛකයෙකුගේ හැටියට අපිට ලැබෙන දවස් පඩිය කීයද කියලා. මම ඊයේ පෙරේදා ගණන් බැලුවා මුද්‍රිත පිටු 300 ලියන්න මගේ අත් අකුරෙන් ඒ 4 කොළ 600 ක්වත් ලියන්න ඕනේ. ඒ වාගේ පොතක් ලියන්න මම අඩුම ගාණේ අවුරුද්දක්වත් ගත කරනවා. ඒ පොත රු.500 ට විකුණවයි කියමු. එතකොට පොත් 1000 ක් වෙනුවෙන් මට රුපියල් පනස්දාහක් ලැබෙනවා තමයි. ඒත් ඒ පනස්දාහස 365 න් බෙදුවාම කීයද? දවසකට රු.136.98 යි. කම්කරුවා පැය අටක් වැඩ කරන කොට මම උදේ ඉඳලා රෑ දොලහ වනතුරු වැඩකරනවා. මේ රටේ ලේඛකයෙකුගේ තත්ත්වය ඕක තමයි. ඒත් අයිසේ, අපි මේවා දිගටම කරගෙන යන්න ඕනේ. කවදාවත් ලේඛකයෙක් සල්ලි බලාගෙන මේ වැඩේ කරන්න හොඳ නෑ. අපේ යුතුකමක් තියෙනවා මේ රටේ පාඨකයන් වෙනුවෙන් යමක් කරන්න. පාඨකයන්ගේ රසඥතාවය වර්ධනය කරන්න. අන්න ඒක හිතාගෙන හැම තිස්සෙම වැඩ කරන්න''

අවසන් ගමන් ගිය සිරිල් සී.පෙරේරා සූරීන්ගේ මෙම ඔවදන මෙරට ලේඛකයන් ආදර්ශයට ගැනීම එතුමාට කළ හැකි ලොකුම උපහාරයයි. සිරිල් සී. පෙරේරා සූරීන්ට නිවන් සුව පතමි.